2023

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT



තල් සංවර්ධන මණ්ඩලය
பனை அபிவிருத்திச் சபை
Palmyrah Development Board

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
பெருந்தோட்ட கைத்தொழில் அமைச்சு
Ministry of Plantation Industries

වාර්ෂික වාර්තාව

2023

වාර්ෂික වාර්තාව 2023

வருடாந்த அறிக்கை 2023

Annual Report 2023



වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

பெருந்தோட்ட கைத்தொழில் அமைச்சு

Ministry of Plantation Industries

තල් සංවර්ධන මණ්ඩලය

பனை அபிவிருத்திச்சபை

Palmyrah Development Board

අපගේ දැක්ම/ எமது தூரநோக்கு / Our Vision

තල් ආශ්‍රිත නිෂ්පාදන දේශීය සම්පත් හා පරිසරයේ යහ පැවැත්ම තහවුරු කරන අතර රටේ දළ ගෘහස්තනිෂ්පාදනයෙහි තීරණාත්මක දායකය බවට සංවර්ධනය කිරීම

வளங்களையும் சூழலையும் அழியாமல் பாதுகாக்கும் அதே வேளையில் நாட்டின் மொத்த உள்நாட்டு உற்பத்திக்கு அர்த்தம் மிகுந்த பங்களிப்பைக் கொடுக்கும் பனை வளங்களை அபிவிருத்தி செய்வது.

To develop the Palmyrah sector into significant contributor to the Gross Domestic Product of the country while sustaining the resources and its environment.

අපගේ මෙහෙවර/ எமது பணிக்கூற்று / Our Mission

තල් කර්මාන්තය හා සම්පත් ක්‍රමානුකූලව දියුණුකිරීම සහ නගා සිටුවීම

பனைக் கைத்தொழிலையும் பனை வளங்களையும் ஒழுங்குபடுத்தி அபிவிருத்தி செய்தலும் முன்னேற்றுகலும்.

To regularize develop and promote Palmyrah industry and Palmyrah resources

අන්තර්ගතය **පිටු අංකය**

1) තල් සංවර්ධන මණ්ඩලය පිළිබඳ හැඳින්වීම 1
1.1 අරමුණු සහ ඉලක්ක 1
1.2 සභාපතිවරයාගේ වාර්තාව 2
1.3 සාමාන්‍යාධිකාරීගේ වාර්තාව 3
2) සංස්ථායික පාලනය
2.1 අධ්‍යක්ෂ මණ්ඩලය 4
2.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 4
2.3 ගිණුම් පරීක්ෂණ හා කළමනාකරණ කමිටුව 5
2.4 අභ්‍යන්තර පාලනය 5
2.5 කළමනාකරණය 6
3) සංස්ථායික තොරතුරු 7
4) තල් සම්පත් හා ප්‍රයෝජනය 8
5) වෘත්තීන්ට අදාළ අංශයන්හි කාර්ය සාධන වාර්තාව
5.1 වගා හා සංවර්ධන අංශය 10
5.2 ව්‍යාප්ති අංශය 13
5.3 නිෂ්පාදන අංශය 15
5.4 පරිපාලන අංශය 29
5.5 අලෙවිකරණ අංශය 22
5.6 පර්යේෂණ අංශය 25
5.7 මූල්‍ය සමාලෝචනය 29
5.8 අවදානම් කළමනාකරණය 30
5.9 උපායමාර්ගික ක්‍රියාමාර්ග 30
5.10 මානව ප්‍රාග්ධනය 31
5.11 පාරිසරික වාර්තාකරණය 31
5.12 අභියෝග 32
6) සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති
6.1 පොදු ගිණුම් ප්‍රතිපත්ති 33
6.2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම 33
6.3 බැරකම් හා ප්‍රතිපාදන 34
6.4 ආදායම් ප්‍රකාශය 35
6.5 මුදල් ප්‍රවාහය 36
6.6 රජයේ ප්‍රදානයන් 36
7) මූල්‍ය ප්‍රකාශ - අනාවරණ
7.1 ශේෂ පත්‍රය 37
7.2 ලාභ හා අලාභ ගිණුම 38
7.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 39
7.4 හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 41
7.5 ඇයවැය මෙහෙයුම් 42
7.6 මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් අංක 1 සිට 16 43
7.7 ශේෂ පිරික්සුම 51
8) විගණකාධිපතිගේ වාර්තාව 56

1. තල් සංවර්ධන මණ්ඩලය පිළිබඳ හැඳින්වීම.

තල් සංවර්ධන මණ්ඩලය 1971 වසරේ 46 වැනි අංකය දරණ ශ්‍රී ලංකා පොල් සංවර්ධන පණත් සංශෝධනය මත පදනම්ව, 1975 වසරේ අංක 24 වැනි පණතේ ප්‍රකාරයෙන්, 1978 වසරේ අගෝස්තු මස 18 වැනිදා නිකුත් වූ ගැසට් නිවේදනයක් අනුව, වැවිලි අමාත්‍යාංශය යටතේ තල් සම්බන්ධ කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා පිහිටුවන ලද ආයතනයකි.

2020 වසරේ සැප්තැම්බර් 25 වැනිදා නිකුත් කරන ලද 2194/74 වැනි ගැසට් නිවේදනය මගින්, එය තවදුරටත් ක්‍රියාත්මක වන්නේ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ය.

1.1 අරමුණු සහ ඉලක්ක

- තල් සම්බන්ධව ඇති සමාජ හා ආර්ථික සංවර්ධනයට දායක වන ආයතනික පදනමක් පිහිටුවීම.
- ශ්‍රී ලංකාවේ තල් පදනම්ව ඇති කර්මාන්ත ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය සඳහා විද්‍යාත්මක හා උසස් තාක්ෂණික මට්ටමේ දියුණු පදනමක් ස්ථාපිත කිරීම.
- මූලික ක්‍රමවේද සහ උසස් තාක්ෂණ සංවර්ධනය සඳහා පරීක්ෂණාත්මක පර්යේෂණ මගින් තල් වගාව පිළිබඳ ආරක්ෂාව, පවත්වා ගැනීම, නිෂ්පාදනය හා සංවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණයන් වර්ධනය කිරීම.
- ඒකාබද්ධ සංවර්ධන උත්සාහයන් මූලික කරගෙන, තල් හා පශු සම්පත් සම්බන්ධ වගා ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම මඟින් තල් භූමියේ නිෂ්පාදන හැකියාව වැඩි කිරීම.
- තල් සංවර්ධන මණ්ඩලය මගින් සකස් කරන ලද තාක්ෂණික ක්‍රමවේද, මෙම ක්ෂේත්‍රයේ නිරත වන පුද්ගලයින් සහ ව්‍යාපාරිකයින්ට උපයෝගී වන පරිදි තාක්ෂණ හුවමාරුවක් ලෙස ලබාදීම.
- තල් වල ජාතික ජාන සම්පත් ආරක්ෂා කිරීම හා උසස් තත්ත්වයේ තල් පැළ නිෂ්පාදනය කිරීම.
- තල් සම්බන්ධ තාක්ෂණික දත්ත ප්‍රායෝගික අත්දැකීම්වලට යාවත්කාලීනව ගලපා, ජනප්‍රිය තොරතුරු සමඟ සසඳා පළ කිරීම හා විසරණය කිරීම.
- තල් සම්බන්ධ ආයතනික සංවර්ධනය සහ සහයෝගීතාවයන් මඟින් නිෂ්පාදන කළමනාකරණ ක්‍රමවේදයන් ව්‍යුහගත කර යාවත්කාලීන කිරීම සහ ඒවා පහසු කිරීම.

1.2 සභාපතිතුමාගේ ප්‍රකාශය



තල් සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා ලෙස, 2023 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සඳහා මගේ පණිවිඩය ඉදිරිපත් කරනුයේ මානසික සතුටක් හා ගෞරවය සමඟය.

දැනට රට දැරිය යුතු ආර්ථික අභියෝගයන් මැද, විශේෂයෙන් ම තල් වගා නිෂ්පාදන සම්බන්ධ අපනයන ක්ෂේත්‍රය යටතේ විශේෂ අවධානයක් යොමුකර ඇත. මේ අනුව, උතුරු නැගෙනහිර පළාත්වල පරිපූර්ණ ලෙස වර්ධනය වන ප්‍රධාන වගාව වශයෙන් තල් වගාව ආශ්‍රිතව වටිනාකම් එකතු කළ නිෂ්පාදන මගින් ජාත්‍යන්තර වෙළඳපොළට පිවිසීම සඳහා නවීන තාක්ෂණය භාවිතා කරමින් මණ්ඩලය විසින් ක්‍රියාත්මක උත්සාහයන්ට ප්‍රමුඛතාවය දී ඇත.

පර්යේෂණ කටයුතු මගින් තල් ආශ්‍රිත නිෂ්පාදනවල තත්ත්වය වර්ධනය කිරීම, නව ඇසුරුම් තාක්ෂණයන් හඳුන්වා දීම, තත්ත්ව පාලන පරීක්ෂණ, අඛණ්ඩ හැකියාව වර්ධන පුහුණු වැඩසටහන්, සහ ආදර්ශ නිෂ්පාදන මධ්‍යස්ථාන ආරම්භ කිරීම ආදිය මඟින් තල් සංවර්ධන මණ්ඩලය තල් නිෂ්පාදන අපනයන තත්ත්වයට නංවා ගැනීමට අරමුණු කෙරේ.

පසුගිය වසරවලට සාපේක්ෂව තල් නිෂ්පාදනවල අපනයනය සලකිය යුතු ලෙස වැඩි වීමක් පෙන්නුම් කර ඇති අතර, දේශීය වෙළඳපලවලද විකුණුම් වටිනාකම සැලකිය යුතු ලෙස ඉහළ ගිය බව ද දැක්වේ. ඒ හරහා තල් වෘත්තියෙන් ජීවිතය ගෙවමින් සිටින ජනතාවගේ ආදායම හා ජීවන තත්ත්වය වඩාත් වර්ධනය වී ඇති අතර, මෙම ක්ෂේත්‍රය අනාගතයේදී රටට විදේශ විනිමය උපයා දිය හැකි තවත් වගා කර්මාන්තයක් ලෙස හැදෙමින් පවතින බව කිසිදු සැකයක් නොමැත.

මෙම ක්‍රියාවලිය සඳහා තම ආධාරය සහ සහයෝගය ලබා දී ඇති අධ්‍යක්ෂ මණ්ඩලය, අපගේ මණ්ඩලයේ නිලධාරීන්, කොටස්කරුවන්, ගනුදෙනුකරුවන්, විශේෂයෙන්ම අපගේ ගරු අමාත්‍යතුමන්ට සහ අමාත්‍යාංශයේ ලේකම්තුමන්ට මගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

පී. ඒ. ක්‍රිශාන්ත පතිරාජ
සභාපති
තල් සංවර්ධන මණ්ඩලය

1.3 සාමාන්‍යාධිකාරිගේ ප්‍රකාශය



ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනයාගේ මූලික ආදායම් මාර්ගය වශයෙන් තල් ආශ්‍රිත අතින් කෙරෙන කුඩා කර්මාන්ත ක්ෂේත්‍රය දැක්වේ. උතුරු සහ නැගෙනහිර පළාත්වල පමණක් 12,000කට වැඩි පවුල් තල් සම්බන්ධ කුඩා කර්මාන්ත මත ව්‍යාපාරිකව සහ ආදායම් මතක් වශයෙන් රැඳී සිටී. ස්වාභාවිකව නිපදවනු ලබන තල් නිෂ්පාදනවලට ලංකාව පමණක් නොව ජාත්‍යන්තරයේද ඉහළ ඉල්ලුමක් පවතින බවද එය මෙම කර්මාන්තයේ අනාගත වර්ධනය සඳහා දැඩි රුකුලක් වී තිබේ.

මෙම අවස්ථාව තුළ තල් සංවර්ධන මණ්ඩලය නිෂ්පාදන ප්‍රමාණය වැඩි කිරීම සහ නිෂ්පාදනවල තත්ත්වය උසස් කිරීම සම්බන්ධයෙන් 2023 වසර පුරා විශේෂ අවධානයක් යොමු කර ඇත. විශේෂයෙන්ම, කාරෙයිනර් සහ කයිතාඩි නිෂ්පාදන මධ්‍යස්ථාන සඳහා **GMP (Good Manufacturing Practices)** ප්‍රමිතීන්ට අනුව තත්ත්ව සහතික ලබා දී ඇත. යාපනය දිස්ත්‍රික්කයේ කයිට්ස්, කාරෙයිනර්, මන්නාරම් දිස්ත්‍රික්කයේ පඩප්පඩි, කට්ටුකාරන්කුලම්, තරවන්කෝට්ටායි සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වරෝදය නගරය යන ස්ථානවල නිෂ්පාදන මධ්‍යස්ථාන පුනර්නිර්මාණය කරමින්, එහි නිෂ්පාදන ඵලදායීතාවය හා තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

මෙම වසර තුළ තල් සංවර්ධන මණ්ඩලයේ නිෂ්පාදන මධ්‍යස්ථාන මඟින් රුපියල් මිලියන **34.10 ක් වටිනා** තල් ආශ්‍රිත නිෂ්පාදන නිපදවා ඇත. අතින් කෙරෙන නිෂ්පාදන වැඩි කිරීම හා රැකියා අවස්ථා සෑදීමේ අරමුණින් උතුරු, නැගෙනහිර, හම්බන්තොට සහ පුත්තලම දිස්ත්‍රික්කවලදී පුහුණුකරුවන් **479** දෙනෙකු සඳහා අතින් කරන තල් නිෂ්පාදන පුහුණු වැඩසටහන් මෙහිදී සිදුකර ඇත. අපගේ "කට්පහම්" වෙළඳසැල්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ප්‍රදර්ශනවල ජංගම විකුණුම් ක්‍රමයන් හරහා මෙම වසර තුළ රුපියල් මිලියන **65.42** ක විකුණුම් ආදායමක් ලබා ගැනීමට හැකිවිය. මෙය පසුගිය වසරට සාපේක්ෂව 32.74% ක වර්ධනයකි.

මෙම වසර තුළ විද්‍යාත්මක පර්යේෂණය සඳහා පරීක්ෂණ 15ක් පැවැත්වුණි. විශේෂයෙන්ම ආහාර නියැදි විශ්ලේෂණ වාර්තා සැපයීම හරහා රුපියල් මිලියන **1.03** ක ආදායමක් උපයා ගැනීමට හැකිවිය. ඊට අමතරව, විනාශ වීමේ අවදානමට ලක්ව ඇති තල් සම්පත නැවත ස්ථාපිත කිරීමේ අරමුණින් තල් සංවර්ධන මණ්ඩලය විසින් **232,600 තල් බීජ** උතුරු සහ නැගෙනහිර පළාත්වල සිටුවා ඇත. මෙය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහයෝගය ඇතිව සිදුකරන ලදී. එමෙන්ම, නීති විරෝධී ලෙස තල් වෘක්ෂ කැපීමේ ක්‍රියාවලිය මැඩ පවත්වන ව්‍යාපෘතිවලද සක්‍රීයව යෙදෙයි.

මෙවන් ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමේ දී අප සමඟ එකතු වී කටයුතු කළ සභාපතිතුමන්, කළමනාකරණය, නිලධාරීන්, සංගම්, නිෂ්පාදකයින් යන සියලු දෙනාටම මගේ ගෞරවපූර්ව ස්තුතිය පුදකරමින්, තල් සංවර්ධන මණ්ඩලය අනාගතයේ දී තවදුරටත් නව ශක්තියකින් යුතුව ඉදිරියට ගමන් කිරීම සඳහා සියලු අංශවල සහයෝගය අපේක්ෂා කරමි.

එම්. පී. ලෝගනාදන්
සාමාන්‍යාධිකාරී
තල් සංවර්ධන මණ්ඩලය

2. සංස්ථාපිත පාලනය

අපි ලංකාවේ **වරලත් ගණකාධිකාරීවරුන්ගේ** ආයතනය, **රාජ්‍ය ව්‍යවසාය** දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති ක්‍රියාමාර්ග සහ වගකිව යුතු අමාත්‍යාංශය විසින් ලබා දී ඇති නිර්නායකයන් අනුගමනය කරමු.

2.1 අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සාමාන්‍ය වශයෙන් සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විතය. මෙම සාමාජිකයින් ගරු අමාත්‍යතුමා විසින් පත්කිරීම් කරනු ලැබේ.

මෙම මණ්ඩලයේ එක් සාමාජිකයෙකු මූල්‍ය අමාත්‍යාංශය සඳහා වගකිවයුතු අමාත්‍යතුමාගේ නියෝජිතයා ලෙස තේරීපත්වන අතර, ඔහු මණ්ඩලයේ මූල්‍ය කටයුතු සඳහා වගකිවයුතු සාමාජිකයා වශයෙන් ක්‍රියාකරයි. අනෙකුත් සාමාජිකයින් අතරින් එක් අයෙකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස අමාත්‍යතුමා විසින් පත් කෙරේ.

වගුව 1: මණ්ඩලයේ සභාපතිතුමන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් - 2023

නම	තනතුර
පී. ඒ. ක්‍රිශාන්ත පතිරාජ මහතා	සභාපති, තල් සංවර්ධන මණ්ඩලය
එච්. පී. කේ. පෙරේරා මහතා	අධ්‍යක්ෂ
සුමිත් ප්‍රියන්ත හල්විටිගේ මහතා	අධ්‍යක්ෂ
මහාචාර්ය සුප්‍රමනියම් මෝහනදාස් මහතා	අධ්‍යක්ෂ
කන්දරාජා ඉලන්කෝ මහතා	අධ්‍යක්ෂ
සෙල්ලයියා සෙල්වරාසා මහතා	අධ්‍යක්ෂ
කේ. එන්. එස්. රණතුංග මහත්මිය	අධ්‍යක්ෂ

2.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වෙමින් ආයතනයේ ප්‍රතිපත්ති, පරිපාලන සහ කළමනාකරණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණ ගැනීම සිදුකරයි. 2023 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 7ක් පැවැත්වුණි.

වගුව 2: අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් විස්තරය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	පැවති දිනය
පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	24.01.2023
දෙවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	23.03.2023
තෙවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	22.05.2023
සිව්වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	28.07.2023
පස්වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	22.09.2023
හයවැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	20.10.2023
සත්වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	21.12.2023

2.3 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන හා කළමනාකරණ කමිටුව සභාපති ලෙස ක්‍රියා කරන අධ්‍යක්ෂවරයාගේ ප්‍රධානත්වය යටතේ ක්‍රියාත්මක වේ. මෙයට අදාළව, මූල්‍ය අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයෙකු ඇතුළුව වෙනත් අනුක්‍රමික අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු මෙහි සාමාජිකයන් ලෙස ක්‍රියාකරති. ආරාධනාවක් මත ජ්‍යෙෂ්ඨ විගණක කළමනාකරුවන් මෙම රැස්වීම් වලට සහභාගී වෙති.

මෙම කමිටුව තුළින් ආයතනයේ ක්‍රියාදාමයන්ට අදාළ නීතිමය අවශ්‍යතා සහිතව අභ්‍යන්තර පාලන ක්‍රමවේද, අවදානම් කළමනාකරණය, හා වෙනත් විධිමත් ක්‍රියාමාර්ග පිළිබඳව සමාලෝචනයක් සිදු කෙරේ.

වගුව 3: විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් – 2023

නම	තනතුර
එච්. පී. කේ. පෙරේරා මහතා	අධ්‍යක්ෂ
සුමිත් හල්විටිගේ මහතා	අධ්‍යක්ෂ
කේ. එන්. එස්. රණතුංග මහත්මිය	අධ්‍යක්ෂ

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාවේ අරමුණු

1. මණ්ඩලයේ මධ්‍යත හා වාර්ෂික වාර්තා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලද යන්න තක්සේරු කිරීම.
2. කළමනාකරණ අභ්‍යන්තර පාලන ක්‍රමවේද පිළිබඳ වාර්තා සකස් කිරීම.
3. අභ්‍යන්තර, බාහිර හා මූල්‍ය සම්බන්ධ මෙන්ම COPE මණ්ඩලය යෝජනා කළ වාර්තා ක්‍රියාත්මක වීම සනාථ කිරීම.
4. නීති හා ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාත්මක වී ඇති බව සහතික කිරීම.
5. ව්‍යාපාරික අවදානම් කළමනාකරණය පිළිබඳ වාර්තා සැපයීම.
6. විගණන දෙපාර්තමේන්තුවේ වගකීම් නිසි ලෙස ඉටු වීම තහවුරු කිරීම.
7. අභ්‍යන්තර විගණකාධිකාරීන්ගේ වගකීම් නිවැරදිව ක්‍රියාත්මක වීම තහවුරු කිරීම.

2.4 අභ්‍යන්තර පාලනය

ගනුදෙනු ක්‍රියාවලියන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සහ නිවැරදිව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා මිල ඇගයීම් කමිටු, මිල පත් කිරීමේ කමිටු සහ මිලදී ගැනීම් කමිටු පත් කරනු ලැබී ඇත.

අභ්‍යන්තර විගණනය, මූල්‍ය ගෙවීම් සහ ලැබීම් සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් පිළිබඳව දැඩි සවිකම් හා පරීක්ෂාවක් යටතේ ක්‍රියාකරයි.

2.5 කළමනාකරණය

සාමාන්‍යාධිකාරීයාගේ ප්‍රධානත්වය යටතේ, අංශ 7 ක ප්‍රධානීන් ක්‍රියාත්මක වෙති. ඔවුන් දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් සමඟ එක්ව කටයුතු කරති.

එම අංශ ප්‍රධානීන් එක් එක් අංශයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රධාන විධායක නිලධාරියා වන සාමාන්‍යාධිකාරි වෙත වාර්තා කරයි.

වගුව 4: විධායක කළමනාකරණ සාමාජිකයින්ගේ විස්තරය

තනතුරු නාමය	නම	ජංගම දු.ක.අං	විද්‍යුත් ලිපිනය (ඊ-මේල්)
සාමාන්‍යාධිකාරී	එම්.බී. ලෝගනාදන් මහතා	0777176322	Mblogan-cro@yahoo.com
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වැ.බ	එස්. ශ්‍රී විජේන්ද්‍රන් මහතා	0773787380	srthyln@yahoo.com
කළමනාකාරු (මුදල්)	ඩී.එස්. ප්‍රනාන්දු මහතා	0706934416	dsaakalanka@yahoo.com
කළමනාකාරු(පරිපාලන හා මානව සම්පත්)	ජී.කේ. වාහලතන්ත්‍රි මහතා	0712185399	Geethkw2009@yahoo.com
කළමනාකාරු(ව්‍යාප්ති)	ඒ. කවිසිදරන් මහතා	0774400641	extensionpdb@yahoo.com
කළමනාකාරු(ව්‍යවහාරික පර්යේෂණ)	එස්. ශ්‍රී විජේන්දිරන් මහතා	0773787380	srthyln@yahoo.com
කළමනාකාරු(අලෙවි ප්‍රවර්ධන)	බී. සුදාහරන් මහතා	0766688337	sbsuthaharan@yahoo.com
කළමනාකාරු(නිෂ්පාදන)	එම්. හියුබට් ඇන්ටනි මහතා	0766913101	antonygowry@yahoo.com
කළමනාකාරු(සංවර්ධන)	සුමිත්‍රා ජනාදරන් මහත්මිය	0773787380	Sumithira79@yahoo.com
අභ්‍යන්තර විගණක	ජේ. ශ්‍රීවානති මහත්මිය	0768688277	srivanathyj@gmail.com

3. සංස්ථායික තොරතුරු

නම : තල් සංවර්ධන මණ්ඩලය

නෛතික පදනම : **1971** අංක **46** දරන පොල් සංවර්ධන පනත සහ **1975** අංක **24** දරන පොල් සංවර්ධන සංශෝධිත පණත ප්‍රකාරව **1978** අගෝස්තු **18** දින පලකරන ලද අංක **331** දරන ගැසට් නිවේදනය මගින් තල් සංවර්ධන මණ්ඩලය ස්ථාපිත කර ඇත.

සංස්ථාපිත වර්ෂය : **1978**

වගුව 5: ලියාපදිංචි කරන ලද කාර්යාලවල විස්තර

ලියාපදිංචි කාර්යාලය	ලිපිනය	දුරකථන /ෆැක්ස්
ප්‍රධාන කාර්යාලය	තල් සංවර්ධන මණ්ඩලය, නුවර පාර, යාපනය.	021 2222034 021 2224154
නගර කාර්යාලය	498, ගාලු පාර, කොළඹ - 06	011 2364406 011 2364405
ප්‍රාදේශීය කාර්යාලයන්		
මඩකලපුව	බාර් පාර, මඩකලපුව.	065 2223179
ත්‍රිකුණාමලය	ඇතුළත වරාය පාර, ත්‍රිකුණාමලය.	026 2224039
අම්පාර	අංක 20, ජාතික ගෘහ නිර්මාණ දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල, කල්මුනෙයි.	067 2220405
පුත්තලම	බස් ස්ථානය අසල, කල්පිටිය.	032 2260749
මන්නාරම්	පන්සල පාර, සාන්තිපුර, මන්නාරම	023 0000373
වවුනියාව	අංක 67-68, බසාර් වීදිය, වවුනියාව.	024 2222483
මුලතිව්	A9 පාර, මාන්කුලම්, මුලතිව්	021 2060042
කිලිනොච්චි	නුවර පාර, කිලිනොච්චිය.	021 2285638
හම්බන්තොට	වැල්ලවාය පාර, වීරවිල.	047 3221201

විද්‍යුත් තැපෑල : slpdbho@gmail.com & slpalmyrah@gmail.com

වෙබ් අඩවිය : www.pdb.gov.lk

විගණකවරු : විගණකාධිපති දෙපාර්තමේන්තුව

නීති උපදේශක : නීතිපති දෙපාර්තමේන්තුව

බැංකුකරු : ලංකා බැංකුව

තල් සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය යාපනයේ පිහිටා ඇති අතර, එය ප්‍රාදේශීය කාර්යාල නවයකින් 'කටපහම්' නමින් ප්‍රකට විකුණුම් මධ්‍යස්ථාන දහනවය, නිෂ්පාදන මධ්‍යස්ථාන 11 කින්, එක් පර්යේෂණ මධ්‍යස්ථානයකින්, එක් තල් අරක්කු ස්කාගාරයකින් හා ආදර්ශ තල් ගොවිපලකින් සමන්විත ජාලයක් හරහා දීප ව්‍යාප්ත පදනමකින් සිය කටයුතු සිදු කරයි. කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලය සෙසු ප්‍රාදේශීය කාර්යාල, අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය හා වෙනත් වැදගත් ආයතන සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.තල් සංවර්ධන මණ්ඩලය වනාහි තල් මත යැපෙන පවුල් මෙන්ම සාම්ප්‍රදායික තල් කර්මාන්ත දියුණු කිරීම සඳහා සේවය සලසන එකම රජයේ සංවිධානයයි.

4.තල් සම්පත් හා ඒවායේ ප්‍රයෝජන

Borassus flabellifer යන උද්භිද විද්‍යාත්මක නාමය හිමි තල් ශාකය සර්ම කලාපික නියඟයට ඔරොත්තු දෙන ශක්තිමත්ම බෝගයකි. එය ශ්‍රී ලංකාවේ, විශේෂයෙන්ම උතුරු පළාත තුළ ජනතාවගේ ජීවනෝපාය සමග සාම්ප්‍රදායිකවම බැඳී තිබේ. එමෙන්ම තල් ගස දකුණු අප්‍රිකාව, අග්නිදිග ආසියාව, උතුරු ඉන්දුනීසියාව හා ඉන්දියාව යන රටවල හමුවේ. එය ඌණ උපයෝජිත බෝගයක් වන නමුදු එය මෙරට කර්මාන්ත සංවර්ධනය සඳහා විභවයක් ඇති බෝගයකි.

වගුව 06 : ලංකාවේ තල් ගස් ව්‍යාප්තිය

අංකය	දිස්ත්‍රික්කය	තල් ගස් සංඛ්‍යාව
01	යාපනය	3 500 000
02	කිලිනොච්චිය	3 500 000
03	මන්නාරම	3 000 000
04	මුලතිවු	500 000
05	ත්‍රිකුණාමලය	210 000
06	මඩකලපුව	200 000
07	පුත්තලම	120 000
08	අම්පාර	40 000
09	අනුරාධපුර	40 000
10	වවුනියාව	8 000
11	හම්බන්තොට	2 000
එකතුව		11 120 000

වගුව 07: තල් ආශ්‍රිත නිෂ්පාදන

තෙලිජ්ජ ආශ්‍රිත නිෂ්පාදන: ✓ පැණි රස කාරක - හකුරු, පැණි, මී රා හා සූකිරි ✓ මධ්‍යසාර - අරක්කු හා බෝතල් කළ රා ✓ පැසවන ලද නිෂ්පාදනය - විනාකිරි
තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන: ✓ බෝතල් කරන ලද යුෂ පිනාටු, පැනි පිනාටු, ජෑම්, කෝඩියල්, පිළිගැන්වීමට සූදානම් පානය, සෝස්,අයිස්ක්‍රීම්, ජෙලි, ජෙලි යෝගට්,මුහුනු ආලේපන,දත් බෙහෙත්
තල් අල ආශ්‍රිත නිෂ්පාදන: ✓ අල (නැවුම්), වියලූ අල, වියලූ අල පිටි, තම්බන ලද අල පිටි, පාම් පෝෂ, බිස්කට්, කේක් ක්ෂණික කූල් මිශ්‍රණය, සුප් කැට, නුඩිල්ස්
තල් පත්‍ර ආශ්‍රිත නිෂ්පාදන: ✓ සාම්ප්‍රදායික අත්කම්: වියන ලද කූඩ , කජු තේ හා කුළු බඩු ඇසුරුම් පෙට්ටි, තොප්පි, පැදුරු,ඉරටු නිෂ්පාදන,දත් කූරු, බිත්ති සැරසිලි, මේස දරණු, මල් කූඩ, කුලු,පෙට්ටි,අත් බෑග්
තල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන: ✓ **තද කෙඳි -**බර වැඩ සඳහා සාදන ලද බුරුසු, මධ්‍යම කෙඳි - පිරිසිදු කිරීම හා ගෙදර දොර කාර්ය සඳහා සාදන ලද බුරුසු, මෘදු කුඩු - උද්‍යාන වගා මාධ්‍යයක් ලෙස
තල් දැව ආශ්‍රිත නිෂ්පාදන: ✓ වහල සඳහා දැව ලෙස ,ගෘහ භාණ්ඩ, දර සඳහා
කටුව ආශ්‍රිත නිෂ්පාදන(තල් කටු අඟුරු) ✓ දැත් පිරිසිදුකාරක,සපත්තු පොලිෂ්, සක්‍රිය අඟුරු

5. වෘත්තීය අංශවල කාර්යසාධනය සමාලෝචනය කිරීම

5.1 සංවර්ධන අංශය

5.1.1 තල් වගා කටයුතු

තල් වගාව ස්ථාපිත කිරීම හා පවත්වා ගෙන යාම තල් සංවර්ධන මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යයන් දෙකකි. කෘෂි පාදක ආහාර හා වෙනත් පාරිභෝගික භාණ්ඩ සුලභතාව වෙත මග පාදමින් තල් පුනරුත්ථාපනය කිරීම පරිසරයටද අත්වැලකි. තල් කර්මාන්තයේ නිරත හා එහි උන්නතිය සඳහා කටයුතු කරන එකම රාජ්‍ය ආයතනය වශයෙන් තල් සංවර්ධන මණ්ඩලය (PDB) තල් ගහනය වැඩි කිරීම හා දැනට ඇති තල් ගස් ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. මේ සම්බන්ධයෙන් වාර්ෂික තල් සිටුවීමේ වැඩසටහන ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සිදු කෙරේ.

උසස් තත්ත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍ය මේ සඳහා භාවිත කෙරේ. පැළ කිරීමේ භූමි වන්නේ ප්‍රධාන වශයෙන්ම රජයේ ඉඩම්, හිස් ඉඩම්, ගෘහස්ථ ඉඩම් සහ රජයේ ගොඩනැගිලි පරිශ්‍රයන් ය. තල් සංවර්ධන මණ්ඩලයේ සංවර්ධන අංශය සමානුපාතික ලෙස අඩු කාර්ය මණ්ඩලයක් සහිතව කටයුතු කරන නමුදු, එය මෙහි වැඩසටහන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරනු පිණිස තල් සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමග සමීපව කටයුතු කරයි.

වගුව 08 : පසුගිය වර්ෂ තුන තුළ පැළ කරන ලද බීජ පිළිබඳ විස්තර

අංක	දිස්ත්‍රික්කය	**2021**	**2022**	**2023**
01	යාපනය	50,400	71,600	90,450
02	මන්නාරම	55,000	52,520	14,150
03	වවුනියාව	145,000	10,020	-
04	කිලිනොච්චි	-	7,500	11,000
05	මුලතිව්	125,000	3,750	32,000
06	ත්‍රිකුණාමලය	-	24,000	-
07	මඩකලපුව	100,000	36,400	65,000
08	අම්පාර	25,000	78,600	20,000
	මුළු එකතුව	**500,400**	**284,390**	**232,600**



රූපය 1: යාපනය – තල් බීජ වගාව



රූපය 2: මුලතිවු – තල් බීජ වගාව

5.1.2 තල් ගස් කැපීම පාලනය

සැලසුම් රහිත තල් ගස් කැපීම තල් කර්මාන්ත ක්ෂේත්‍රයට විශාල අභියෝගයක් ලෙස පත්ව ඇත. උතුරු නැගෙනහිර පළාත්වල තල් ගස සාම්ප්‍රදායිකව ගෙවතු අවශ්‍යතා සඳහා භාවිතා කරමින් පැවතේ. අත්‍යවශ්‍ය ගෙවතු අවශ්‍යතා සඳහා පමණක් ඵලදීම අවසන් වූ වයස්ගත වගා ගස් කපා හැරීමට අවසර ලබාදෙන නමුත්, මාර්ග පුළුල් කිරීම, විදුලි බෙදාහැරීම, වෙනත් කෘෂිකර්ම කටයුතු සඳහා භූමි පිරිසිදු කිරීම වැනි අවශ්‍යතාත් එක්ව තල් ගස් කැපීම වැඩිවීමට හේතු වී ඇත.

සැලසුම් රහිත තල් කැපීම උදාවන දැඩි ප්‍රතිවිපාක සලකා බලා, තල් සංවර්ධන මණ්ඩලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලැබෙන තල් කැපීම සඳහා වන අයදුම්පත්‍ර පළාත් මට්ටමින්, ප්‍රදේශීය කාර්යාල හරහා සලකා බලමින්, අවසරය ලබාදීමට පෙර යෝජනා ලබාදෙයි.

මෙයට අමතරව, නීති විරෝධී තල් ගස් කැපීමේ ක්‍රියා මර්දනය කිරීම සඳහා ග්‍රාමසේවකවරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්ය මණ්ඩලය සමඟ එක්ව පොලිසියට දැනුම්දීම සහ වන්දි වාර්තා ලබාදීම වැනි සේවාද සිදු කරයි. මෙවැනි පාලන ක්‍රියාමාර්ග නිසා තල් කැපීම කලාප කිහිපයක සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

වගුව 09 : පසුගිය වර්ෂ තුන තුළ ගස් කපා හෙලීම පිළිබඳ විස්තර

අංකය	දිස්ත්‍රික්කය	2021	2022	2023
01	යාපනය	10,514	7,382	4837
02	මන්නාරම	1,189	1,232	843
03	වවුනියාව	186	355	180
04	කිලිනොච්චි	1,391	846	622
05	මුලතිවු	844	823	291
06	ත්‍රිකුණාමලය	453	338	371
07	මඩකලපුව	564	342	596
08	අම්පාර	198	143	28
09	පුත්තලම	-	-	296
	මුළු එකතුව	**15339**	**11461**	**8064**

5.1.3 ආදර්ශ තල් ගොවිපල

බහුතර වගා භූමියන් රජයට අයත් ඉඩම් වන අතර, එවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තල් වගා කටයුතු සඳහා ලබා දී ඇත. මෙම ඉඩම්වලට අවස්ථාවන් අනුව තල් බීජ රෝපණය කර, තල් සංවර්ධන මණ්ඩලයෙහි ආදර්ශ තල් වගා භූමියන් ලෙස සංවර්ධනය කර ඇත. බහුතර ඉඩම් සාම්ප්‍රදායික කෘෂිකර්ම වගා සඳහා සුදුසු නොවන අතර, මින් කිහිපයක පමණක් සුදුසු අතුරු වගා වර්ග සමඟ වගා කර ඇත.

ආදර්ශ වගා භූමියන් තල් කර්මාන්තය සඳහා දීර්ඝකාලීන ආයෝජනයක් වේ. එල ලබාගත හැක්කේ ගස පරිණත වූ පසුවය. ගස පරිණත වීමට වසර 15 සිට 20 දක්වා කාලයක් ගත වන බැවින්, ආදායමක් ලැබීම මූලිකව බලාපොරොත්තු විය නොහැක. පහත දැක්වෙන බහුතර ආදර්ශ වගා භූමියන් තරුණ තල් ගස් සහිත බැවින්, අනාගතයේ වඩාත් ප්‍රභල ප්‍රතිඵල ලබා ගැනීම සඳහා එම වගා නිසි ලෙස නඩත්තු කිරීම අත්‍යවශ්‍ය වේ.

නමුත්, වගා භූමියන් නඩත්තු කිරීම සඳහා වූ වියදම් එම වගාවලින් ලබා ගත හැකි ආදායමට වඩා වැඩිවීම හා එවැනි සියළු වගා භූමියන් නඩත්තු කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම යන කරුණු හේතුවෙන්, විගණන කළමනාකරණ කමිටුව විසින් තෝරාගත් වගා භූමියන් කිහිපයක් පමණක් නඩත්තු කිරීම පිළිබඳව නිර්දේශ කර ඇත. එම නිර්දේශය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කරනු ලැබූ අතර, පහත දැක්වෙන වගා භූමියන් 3ක් නඩත්තු කිරීමට අනුමැතියද ලබා දී ඇත. ඒ අනුව, ඉතිරි ඉඩම්වල වගකීම් ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත එම ඉඩම් පවරා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

වගුව 10: දැනට තල් සංවර්ධන සභාව විසින් නඩත්තු වන ආදර්ශ තල් ගොවිපල පිළිබඳ විස්තර

දිස්ත්‍රික්කය	ස්ථානය හා ප්‍රමාණය	ප්‍රධාන බෝග
යාපනය	මාමුනයි - අක්කර 200 යි	තල් ගස් හා කජු(අක්කර 20 යි)
වවුනියාව	පුලියන්කුලම් - අක්කර 10 යි.	තරුණ තල් ගස්, ලෙමන්
හම්බන්තොට	වීරවිල - අක්කර 22 යි.	තල් ගස් සහ එලවලු,කෙසෙල්,තල වැනි වාර්ෂික බෝග

5.1.4 තල් කර්මාන්ත සම්බන්ධ කටයුතු

තල් සංවර්ධන මණ්ඩලය තුළ වෙනම සැලසුම් අංශයක් නොමැති බැවින්, තල් වගා සංවර්ධන අංශය තල් කර්මාන්තය සම්බන්ධ පහත සඳහන් සැලසුම් ක්‍රියාවලී වල යෙදී ඇත.

- වාර්ෂික ක්‍රියාත්මක සැලසුම් වාර්තාවන් සකස් කිරීම සහ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම
- තල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සැලසුම් යෝජනා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම
- තල් සංවර්ධන මණ්ඩලට වාර්ෂික වාර්තා සකස් කිරීම
- තල් කර්මාන්තය සම්බන්ධ තොරතුරු එකතු කිරීම සහ ලබාදීම

වගුව **11:** **2023 වසර සඳහා තල් සම්බන්ධ නිෂ්පාදකයින්ගේ විස්තරය**

දිස්ත්‍රික්කය	රා නිෂ්පාදනය	අත්කම් නිෂ්පාදන	අල නිෂ්පාදනය	තල් යුෂ	ආහාර නිෂ්පාදනය
කිලිනොච්චි	740	300	300	40	30
යාපනය	1024	360	700	200	50
මුලතිවු	490	105	50	110	7
මන්නාරම	176	135	615	235	-
වවුනියාව	457	260	114	-	-
අම්පාර	-	63	-	-	-
මඩකලපුව	50	300	15	100	30
ත්‍රිකුණාමලය	125	200	100	15	50
පුත්තලම	3	15	10	-	-
වීරවිල	1	32	-	-	-
මුළු එකතුව	**2667**	**1770**	**1904**	**700**	**167**

වගුව **12:** **තල් සම්බන්ධ නිෂ්පාදන ප්‍රවණතාවය**

වර්ෂය	තල් රා (බෝතල්)	තල් අරක්කු (බෝතල්)	තල් හකුරු (කි.ග්‍රෑ.)	තල් අල (කි.ග්‍රෑ.)	පිනාටු (කි.ග්‍රෑ.)	තල් යුෂ (ලීටර්)	අත්කම් නිෂ්පාදන (රු.මිලියන)	දැව
2022	7,508,975	250,000	68,000	380,000	7200	52,000	42.0	11461
2023	7,000,000	120,000	61,000	403,000	7000	27,394	51.0	8,064

5.2. වෘාප්ති අංශය

තල් සංවර්ධන මණ්ඩලය විසින් තල් සම්බන්ධ කුඩා කර්මාන්තයන් සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් වාර්ෂිකව වෘාප්ති අංශය ඔස්සේ සපයනු ලැබේ. තල් නෙලීම, තල් යුෂ සකස් කිරීම, තල් ගසට නැගීම, අත්කම් නිෂ්පාදන සම්බන්ධ පුහුණු වැනි තාක්ෂණික පුහුණු වැඩසටහන් සපයමින් නිෂ්පාදනයට එක්කරන ලදී.

මෙම නිෂ්පාදකයින් තල් සම්බන්ධ නිෂ්පාදකයින්ගේ සංගමයට සම්බන්ධ කරමින්, "කටිපහම්" විකුණුම් මධ්‍යස්ථාන ඔස්සේ වෙළඳපොළට පිවිසීමට අවස්ථාව සපයා ඇත.

වගුව **13:** **2023** වසර සඳහා ලබාදෙන ලද පුහුණු වැඩසටහන්

වැඩසටහන	මූල්‍ය ආධාර	පුහුණු වැඩසටහන් ගණන	පුහුණුලාභීන් සංඛ්‍යාව
තල් කර්මාන්තය– තල් කොළ පුහුණුව (මාස 6)	ප්‍රාග්ධනය	19	344
තල් කර්මාන්තය– තල් කොළ පුහුණුව (මාස 6)	තල් සංවර්ධන මණ්ඩලය	09	135
විශේෂ තල් කර්මාන්තය (යාපනය දිස්ත්‍රික්කය)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	01	10
යුෂ පුහුණුව	ප්‍රාග්ධනය	08	232
තල් ගස් මදින්නන් සඳහා	ප්‍රාග්ධනය	02	112
පුහුණුකරුවන් සඳහා පුහුණුව	ප්‍රාග්ධනය	01	23
එකතුව		**29**	**479**

වගුව **14:** පසුගිය වසර තුනෙහි තල් කර්මාන්තය පුහුණුලාභීන්ගේ සංඛ්‍යාව

දිස්ත්‍රික්කය	**2021** පුහුණුලාභීන්	**2022** පුහුණුලාභීන්	**2023** පුහුණුලාභීන්
යාපනය	149	168	86
කිලිනොච්චි	40	24	50
මුලතිවු	20	23	20
වවුනියාව	63	30	20
මන්නාරම	63	64	68
පුත්තලම	25	31	-
ත්‍රිකුණාමලය	55	75	39
මඩකලපුව	214	191	121
අම්පාර	85	103	75
හම්බන්තොට	-	39	-
කුරුණෑගල	27	18	-
අනුරාධපුර	28	23	-
මුළු එකතුව	**769**	**789**	**479**

වගුව 15: පසුගිය වසර 5හි තල් කර්මාන්ත නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන විස්තරය.

වර්ෂය	නිෂ්පාදකයින්ගේ සංඛ්‍යාව	තල් සංවර්ධන මණ්ඩලයට විකුණූ වටිනාකම (මිලියන)	නිදහස් වෙළඳපොළට විකුණූ වටිනාකම (මිලියන)
2019	1040	12.70	48.60
2020	2364	8.94	28.00
2021	2384	7.96	36.00
2022	2634	14.93	46.00
2023	2776	19.97	65.00



රූපය 3 : මට්ටුවිල් අත්කම් පුහුණු මධ්‍යස්ථානය





රූපය 4: 2023 වසරේ නව තල් කොළ අත්කම් නිර්මාණ

5.3 නිෂ්පාදන අංශය

තල් සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන අංශයක් ලෙස නිෂ්පාදන අංශය කටයුතු කරයි. මෙම අංශය තල් ගසින් ලබාගත හැකි මූලික ද්‍රව්‍යයන් භාවිතයෙන් සම්ප්‍රදායික ක්‍රම සහ පර්යේෂණමය සොයා ගැනීම් ඔස්සේ ආදර්ශ නිෂ්පාදන සකස් කරයි.

මෙම නිෂ්පාදන අතර, ආහාර සම්බන්ධ නිෂ්පාදන ලෙස තල් පලතුරු, තල් යුෂ සහ තල් පැණි යන ද්‍රව්‍යයන් භාවිත කර නිෂ්පාදන සිදු වේ. ආහාර නොවන නිෂ්පාදන ලෙස තල් කොළ, තල් බඩු සහ තල් ගස් කඳ ආදිය භාවිත කර ප්‍රධාන නිෂ්පාදන සකස් කෙරේ.

මෙවැනි ආදර්ශ නිෂ්පාදන, තල් සංවර්ධන මණ්ඩලයේ කටිපහම් වෙළඳ නියෝජිත මධ්‍යස්ථාන හරහා වෙළඳපොලට හඳුන්වා දී ඇත.නිෂ්පාදන අංශයේ ප්‍රධාන අරමුණු වලින් එකක් වන්නේ, පර්යේෂණාත්මක නව නිෂ්පාදන හඳුන්වා දීම මගින් කුඩා කර්මාන්තය ලෙස තල් ක්ෂේත්‍රය විකාශනය කිරීමය.

මෙහිදී වටිනාකම වැඩි කළ ආහාර නිෂ්පාදන ලෙස පාම්පෝෂ (Palmposha),තල් යුෂ,තල් බීම වර්ග,තල් ජෑම්, පනාට්ටු,කේක් වර්ග, බිස්කට් වර්ග, අතුරුපස වර්ග,ක්ෂණික ඔඩියල් යුෂ වැනි භාන්ඩයන් සඳහන් කළ හැක.

අමතරව, **තල් නිෂ්පාදකයින්ගේ ආර්ථික ජීවිතය වර්ධනය කිරීම සඳහා,** ඔවුන්ට විවිධ උපකරණ ලබාදී උනන්දුවක් ඇති කරමින් ඔවුන්ගෙන් තල් අල, තම්බන ලද තල් අල, පැණි, තල් රා, තල් යුෂ වැනි මූලික ද්‍රව්‍යයන් මිලදී ගනිමින්, එම ද්‍රව්‍ය නිෂ්පාදන සහ විකුණුම් සඳහා යොදා ගන්නා ලද

2023 වසරේදී නිෂ්පාදන අංශය මගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති



SCHEDULE TO THE CERTIFICATE OF CONFORMITY

GOOD MANUFACTURING PRACTICES

indexpo

GMP indexpo

Company Name: **PALMYRAH DEVELOPMENT BOARD**
KANDY ROAD, NAVATAKULI, KAITHADY

Address of Applicable Site(s) :

Site 1 : PALMYRAH DEVELOPMENT BOARD - PULP PROCESSING UNIT, KANDY ROAD, NAVATKULI, KAITHADY
(Activities pertaining to manufacturing of palmyrah pulp based products)

Site 2 : PALMYRAH DEVELOPMENT BOARD - TUBER PROCESSING UNIT, KARAINAGAR
(Activities pertaining to manufacturing of palmyrah tuber based products)

Applicable Products and/or Processes :
Activities pertaining to manufacturing of palmyrah tuber based products and pulp based products

Certificate Number : **GMP 0281**

Certificate awarded on 2023-12-07 is valid until 2026-12-06
Date of initial certification 2023-12-07

Ind-Expo Certification Limited
Apt # 01- C, Ocean Tower, Station Road, Colombo 04
Sri Lanka

Email: info@indexpo.lk
Tel: +94 11 2336654
Web: www.indexpo.lk

Director





රූප 5: කාරයිනගර් සහ කයිතඩි නිෂ්පාදන මධ්‍යස්ථාන සඳහා **GMP (Good Manufacturing Practices)** ගුණාත්මක සහතිකය ලබා ගත් බව



රූප 6: කොළඹ දිස්ත්‍රික්කයේ නිෂ්පාදන මධ්‍යස්ථානයේ පැවැති තල් යුෂ සහිත නිෂ්පාදන සඳහා පැවැති පුහුණු වැඩසටහන





උරු 7: නිෂ්පාදන මධ්‍යස්ථාන නඩත්තුකිරීම හා නැවත ගොඩනැගීම - කාරයිනගර්, කට්ටුකාරන් නාගරික නේවාසික ප්‍රදේශය, වරොධ්‍යනගර්

වගුව 16: නිෂ්පාදන මධ්‍යස්ථාන විස්තරය

දිස්ත්‍රික්කය	**නිෂ්පාදන මධ්‍යස්ථාන**	**නිෂ්පාදන මධ්‍යස්ථානවල නිෂ්පාදන**
යාපනය	කාරයිනගර්	තල් අල ආශ්‍රිත නිෂ්පාදන, තල් රා ආශ්‍රිත නිෂ්පාදන, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
	කයිතඩි	තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
	සිංගයිනගර්	තල් රා ආශ්‍රිත නිෂ්පාදන, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
මන්නාරම	තරවන්කොටේ	තල් රා ආශ්‍රිත නිෂ්පාදන, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
	පඩප්පඩි	තල් රා ආශ්‍රිත නිෂ්පාදන, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
	කට්ටුකාරන් කුඩියරප්පු	තල් රා ආශ්‍රිත නිෂ්පාදන
වවුනියාව	පුලියන්කුලම්	තල් අල ආශ්‍රිත නිෂ්පාදන
ත්‍රිකුණාමලය	වරොධ්‍යනගර්	තල් රා ආශ්‍රිත නිෂ්පාදන, තල් යුෂ ආශ්‍රිත නිෂ්පාදන
පුත්තලම	කල්පිටිය	තල් කෙදි , තල් යුෂ නිෂ්පාදන
කොළඹ	වැල්ලවත්ත	තල් චොකලට්, තල් බිස්කට්, තල් කේක්, තල් කැවුම් තට්ටු වඩේ
මඩකලපුව	වෙලිච්චවීටඩි	තල් පානය, තල් යුෂ නිෂ්පාදන

වගුව **17:** තල් සංවර්ධන මණ්ඩලයේ නිෂ්පාදන මධ්‍යස්ථානවල අතුරු වාර්ෂික නිෂ්පාදන තොරතුරු

නිෂ්පාදන	ඒකකය	2021	2022	2023
තෙලිජ්ජ ආශ්‍රිත නිෂ්පාදන				
හකුරු නිෂ්පාදනය	මුළු නිෂ්පාදනය කිලෝ ග්‍රෑම්වලින්	6664.00	6357.254	5,820.15
පැණි නිෂ්පාදනය	මුළු නිෂ්පාදනය ලීටර්වලින්	3899.63	3952.89	6222.90
සූකිරි නිෂ්පාදනය	මුළු නිෂ්පාදනය කිලෝ ග්‍රෑම්වලින්	46.7	29.95	11.50
එල / යුෂ ආශ්‍රිත නිෂ්පාදන				
යුෂ නිෂ්පාදනය	මුළු නිෂ්පාදනය ලීටර්වලින්	13466.75	20289.75	10,775.25
සිසිල් බීම නිෂ්පාදනය	බෝතල් සංඛ්‍යාව (190 මි.ලී.)	6990.00	1759.78	8,417
පාම් ක්‍රෂ් නිෂ්පාදනය	බෝතල් සංඛ්‍යාව (750 මි.ලී.)	2556.00	2526.00	2,081
පාම් ක්‍රෂ් නිෂ්පාදනය	බෝතල් සංඛ්‍යාව (375 මි.ලී.)	856.00	918.00	1,131
ජෑම් නිෂ්පාදනය	බෝතල් සංඛ්‍යාව (400 ග්‍රෑම්)	495.00	318.00	526.75
පනාටු නිෂ්පාදනය	මුළු නිෂ්පාදනය කිලෝ ග්‍රෑම්වලින්	507.700	213.00	496.40
පනාටු	මුළු නිෂ්පාදනය කිලෝ ග්‍රෑම්වලින්	466.50	218.5	275
කුළු බඩු එක් කරන ලද පනාටු	මුළු නිෂ්පාදනය කිලෝ ග්‍රෑම්වලින්	5023.00	2389.00	4,279
කැවුම් නිෂ්පාදනය	නිපදවන ලද ඒකක (කෑලි) සංඛ්‍යාව	2652.00	1995.00	3,457
තල් පලකාරම් නිෂ්පාදනය නිෂ්පාදනය	නිෂ්පාදනය කරන ලද පැකට් සංඛ්‍යාව	21784.00	9280.00	-
අල ආශ්‍රිත නිෂ්පාදන				
තම්බන ලද වියලි අල	මිලට ගත් මුළු ප්‍රමාණය කිලෝ ග්‍රෑම්වලින්	2150.00	979.75	1248.50
වියළන ලද අල පිටි		1587.00	1916.5	2791

තම්බන ලද හා වියළන ලද අල නිෂ්පාදනය	මිලට ගත් මුළු ප්‍රමාණය කිලෝ ග්‍රෑම්වලින්	1699.00	980.5	2.619
තම්බන ලද වියළි අල නිෂ්පාදනය (සීවල් ඕඩියල්	මිලට ගත් මුළු ප්‍රමාණය කිලෝ ග්‍රෑම්වලින්	470.00	1014.75	715
රවුම් වියළි අල පෙති බැදුම්		76.500	681.25	527
වියළි අල පිටි නිෂ්පාදනය	මුළු නිෂ්පාදනය කිලෝ ග්‍රෑම්වලින්	729.00	2803.60	1752
ඕඩියල් කූල් නිෂ්පාදනය	නිෂ්පාදනය කරන ලද පැකට් සංඛ්‍යාව (150ට)	169.00	75.00	262
පාම් පෝෂ නිෂ්පාදනය	මුළු නිෂ්පාදනය කිලෝ ග්‍රෑම්වලින්	818.75	262.5	814.25
අනිත් නිෂ්පාදන				
තල් නොවන නිෂ්පාදන (මෝරු මිරිස්, මාස්මෙලෝ, ග්ලූකෝරස, තට්ටු වඩේ)	පැකට්	1333.00	1157.00	1090
විකිණුම් බවට හරවන ලද නිෂ්පාදිතයෙහි වටිනාකම (රුපියල් මිලියන)		17.76	20.59	34.10

5.4 පරිපාලන අංශය

5.4.1 මානව සම්පත් කළමනාකරණය

1. **උසස්වීම ලබාදුන් නිලධාරීන් කිසිවෙකු නොමැත**
2. **විශ්‍රාම ගිය නිලධාරීන්**
    - I. එස්. මසුදා උම්මා – කළමනාකරණ සහකාර
    - II. ඒ. සුගුනා – කළමනාකරණ සහකාර
    - III. ටී. ශ්‍රීදේවි – පරිපාලන නිලධාරී
    - IV. එම්.බී. ලෝගනාදන් – සාමාන්‍යාධිකාරි

3. **තනතුරු අත්හැරගිය නිලධාරීන්**
    - I. එස්.ඩී.ටී.ජේ. බණ්ඩාර – අභ්‍යන්තර විගණකාධිකාරී
    - II. උපුල් නිශාන්ත – කම්කරු
    - III.ඩබ්. එස්.එස්.එම්. ප්‍රනාන්දු – කළමනාකරණ සහකාර
    - IV. ඒ.වී.බී.ජේ. ගුණරත්න – විගණකාධිකාරී
    - V. එස්. ජෙගන් – කම්කරු
    - VI. ඩී. සන්ජයන් – කම්කරු
    - VII. ආර්. මදනදාස් – කළමනාකරණ සහකාර
    - VIII. ආර්. ඉලංකන් – කළමනාකරණ සහකාර
    - IX. එස්. චන්ද්‍රකාන්තාන් – කළමනාකරණ සහකාර

වගුව **18: තල් සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය - 31.12.2022**

අංකය	**31.12.2022** වන විට තනතුරු නාමය	අනුමත වූ කාර්ය මණ්ඩලය	වත්මන්කාර්ය මණ්ඩලය
1	විධායක ශ්‍රේණිය	14	06
2	සුපරීක්ෂකවරු / තාක්ෂණික නිලධාරි /විකුණුම්කරු	20	14
3	කළමණාකරන සහකාර හා එකාබද්ධ සේවාව	82	60
4	පුහුණු හා අර්ධ පුහුණු සේවකයෝ	61	55
5	සෙසු කාර්ය මණ්ඩලය සහ නුපුහුණු සේවකයෝ	50	49
6	අනියම් සේවකයෝ හා පුහුණුලාභී සේවකයෝ	-	-
7	**මුළු සේවක සංඛ්‍යාව**	227	184


5.4.2 භෞතික සම්පත් කළමනාකරණය

අ) වාහන අංශය මඟින් පහත දැක්වෙන ලේඛන නඩත්තු කෙරේ

1. වාහන සම්බන්ධ දේපළ සඳහා ලියාපදිංචි පොත
2. වාහන නඩත්තු හා අනෙකුත් සේවා සඳහා ලේඛන පොත

සංවිධාන ව්‍යුහය

තල් සංවර්ධන මණ්ඩලය
සංවිධාන ව්‍යුහය



5.5 අලෙවි අංශය:

තල් සංවර්ධන මණ්ඩලයේ කටිපහම් අලෙවි මධ්‍යස්ථාන හරහා මෙන්ම දිස්ත්‍රික් මට්ටමින් සහ ප්‍රදේශ මට්ටමින් පැවැත්වෙන ප්‍රදර්ශන සහ ජංගම අලෙවි වැඩසටහන්වල දායකත්වය ලබාදී මණ්ඩලයේ අලෙවි කටයුතු ඉදිරියට ගෙන යනවා. මෙයින් ප්‍රමාණවත් තල් ආශ්‍රිත නිෂ්පාදකයින්ට වෙළඳ අවස්ථා සලසා දීම විශේෂ වශයෙන් සලකනු ලැබේ.

එමෙන්ම, තල් ආශ්‍රිත අපනයන පුළුල් කිරීමේ අරමුණින් අපනයනකරුවන් සමූහ කර, අපනයනකරුවන්ගේ හමුවක් සංවිධානය කර ඔවුන් මුහුණ දෙන්නා වූ ගැටලු විසඳීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර තිබීමත් විශේෂයි.

වගුව 19 : කට පහම් අලෙවි මධ්‍යස්ථාන පිහිටි ස්ථාන පිළිබඳ විස්තර

දිස්ත්‍රික්කය	පිහිටීම
යාපනය	පේදුරුතුඩුව පාර, නල්ලූර්, යාපනය
	අංක - 129 ඩී, කන්කසන්තුරේ පාර යාපනය
	බස් ස්ථානය, යාපනය
	මහනුවර පාර, කයිතඩි, යාපනය
කොළඹ	අංක - 498, මෙගා සිටි කටිපහම්, ගාලු පාර, කොළඹ
නාරාහේන්පිට	නවම් මාවත, නාරාහෙන්පිට
මීගමුව	ලුවිස් පෙදෙස කුඩාපාඩුව මීගමුව
මහනුවර	අංක -309, පේරාදෙණිය පාර, මහනුවර
මන්නාරම	මඩු පාර, මන්නාරම
	මන්නාරම නගරය, මන්නාරම
මඩකලපුව	15 යූ.ඩී. ඒ ගොඩනැගිල්ල, මඩකලපුව
	ප්‍රදර්ශන ශාලාව, වෙලිච්චවීටු, මඩකලපුව
කිලිනොච්චිය	අරිවියල් නගර්, කිලිනොච්චිය
ත්‍රිකුණාමලය	විදුලි ස්ථානය පාර, ත්‍රිකුණාමලය
	ප්‍රධාන පාර, වරොධ්‍ය නගරය, ත්‍රිකුණාමලය
අම්පාර	නාවිධන්වෙළි, කල්මුනේ.
වවුනියාව	67-68, වෙළඳ පාර, වවුනියාව
පුත්තලම	නව බස් ස්ථානය, කල්පිටිය
හම්බන්තොට	පන්සල ඉදිරිපිට, තිස්සමහාරාමය

වගුව- **20:** අවුරුදු **3**කට පෙර කට්පහම් අලෙවි මධ්‍යස්ථානවල සම්පූර්ණ අලෙවි

දිස්ත්‍රික්කය	මධ්‍යස්ථානය	2021	2022	2023
යාපනය	නල්ලූර්	9,097,324.76	10,239,084.80	18,581,319.45
	ප්‍රදර්ශන ශාලාව	842,642.00		
	කන්කසන්තුරේ පාර	1,373,055.80	197,252.00	
	බස් නැවතුම්පොළ	608,851.90	1,975,365.90	1,733,480.00
	මන්තිකයි	-	-	
	කයිතඩි	549,709.00	910,028.00	1,590,545.00
	කාර්ගිල්ස්	445,335.00	105,040.00	254,305.00
	ප්‍රදර්ශනය	437,301.00	1,053,796.00	2,815,181.00
	අපනයන	-	-	-
කොළඹ	මෙගාසිටි, මීගමුව	11,976,227.84	13,924,394.99	17,142,074.40
	නාරාහේන්පිට		764,621.00	349,271.00
මහනුවර	කට්පහම්	1,895,074.00	5,286,400.20	6,886,818.99
වවුනියා	කට්පහම්	2,110,465.00	2,769,835.00	4,254,065.00
මඩකලපුව	කට්පහම්	983,772.00	4,231,381.00	2,379,440.00
	ප්‍රදර්ශන ශාලාව	726,732.00	2,567,412.00	857,715.00
අම්පාර	කට්පහම්	107,805.00	551,411.00	302,536.00
මන්නාරම	කට්පහම්	543,996.00	2,184,223.00	3,963,737.00
	මඩු කට්පහම්	107,805.00	597,344.00	664,290.00
ත්‍රිකුණාමලය	කට්පහම්	714,479.70	1,010,350.00	1,249,665.00
	වරොධ්‍ය නගරය	-	144,870.00	577,647.50
පුත්තලම	කට්පහම්	24,042.00	49,710.00	291,916.00
හම්බන්තොට	වීරවිල	129,935.00	227,969.50	361,156.00
	තිස්සමහාරාමය	269,950.00	459,745.00	651,387.50
කිලිනොච්චි	කට්පහම්		82,109.00	346,615.00
මුලතිව්				23,800.00
එකතුව		**33,496,625.00**	**50,057,661.39**	**65,416,756.84**

5.5.1. පන්මැර නිෂ්පාදන අපනයනය

පහසුකම් සපයන ක්‍රමයක් ලෙස අපනයනය කරන අය සමඟ රැස්වීමක් පවත්වන ලදී. ලියාපදිංචි වී සිටින අපනයනකරුවන්ගෙන් ලැබුණු දත්ත අනුව, 2023 වර්ෂයේ පන්මැර නිෂ්පාදන අපනයන සමස්ත වටිනාකම රු. මිලියන 57.83ක් විය.

2023 වසරේදී නිෂ්පාදන අංශය මගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති



රූප 8: කාර්මික සංවර්ධන සභාවේ ප්‍රදර්ශනය – කොළඹ



රූප **9:** යාපනය විශ්වවිද්‍යාල ප්‍රදර්ශනය





රූප **10:** කාර්මික සංවර්ධන සභාවේ ප්‍රදර්ශනය – යාපනය





රූප **11:** නව කට්පහම් මධ්‍යස්ථානය විවෘත උලෙළ – කිලිනොච්චි විශ්වවිද්‍යාලය

5.6 පර්යේෂණ අංශය

5.6.1. විශ්ලේෂණ විද්‍යාගාරය

2017 සිට SLAB සහ ISO/IEC 17025:2017 සම්මතය සඳහා ලබාගෙන ඇත. ජනවාරි මාසයේ ISO ඇගයීම් ක්‍රියාවලිය පැවැත්විණි. මස අවසන් වන විට SLSI සඳහා සවිස්තර ක්‍රියාමාර්ග ඉදිරිපත් කරනලදී. තල් රා වල මධ්‍යසාර ප්‍රමාණය, අම්ලත්වය සහ ගනුදෙනු හැකියාව සම්බන්ධයෙන් සොයා බැලීම සැලසුම් කරන ලදී. රසායනික විශ්ලේෂණ වාර්තා 208ක් ලබා දී රුපියල් 1,036,016.00 ආදායමක් උපයන ලදි.

පර්යේෂණ සහ ප්‍රකාශන

- ක්ෂණික සුප් කැට - සබරගමුවිශ්වවිද්‍යාලය සමඟ එක්ව සිදු කරන ලදි. සාරාංශය දෙවැනි විශ්වවිද්‍යාලීය පර්යේෂණ සමුළුවේ ඔක්තෝබර් 2023 දී ප්‍රකාශයට පත් විය.
- ජීවී ක්‍රියාකාරී ගුණ සහිත තල් යුෂ කුඩු: ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ එක්ව සිදු කරන ලදි. ‘‘ආහාර රසායනාත්මක ප්‍රගති’’ සඟරාවේ අගෝස්තු 2023 දී ප්‍රකාශයට පත් ලිපියක්.



රූපය 12: තල් යුෂ වෙන් කිරීම සහ ආරක්ෂාව



රූපය 13: ක්ෂණික සුප් කැට නිෂ්පාදනය

5.6.2. ක්ෂුද්‍රජීව විද්‍යාගාරය

අනුමත සහ ISO මෙහෙයුම්

- SLAB අනුමත ISO/IEC 17025:2017; SLAB පරීක්ෂණය අවසන් විය. ජාතික ජල සම්පාදන සහ ජලප්‍රවාහන මණ්ඩලය සඳහා ISO අණුකූල විශ්ලේෂණයක් සිදු කරන ලදි.

පරීක්ෂණ සේවාවන්

- පරාමිතිකයන් 445ක් සහිත ආහාර සාම්පල 203ක් විශ්ලේෂණය කරන ලදි.

ප්‍රකාශන

- කිරි වර්ග නොමැති ආහාර ද්‍රව්‍යවල තල් යුෂවල (තල් යුෂ) භෞතික, රසායනික සහ ජීවවිද්‍යාත්මක ගුණාංග - සබරගමු විශ්වවිද්‍යාල පර්යේෂණ සමුළුවේ 2023 දී ප්‍රකාශයට පත් විය.

5.6.3. ජීව රසායනාගාරය

පර්යේෂණ

- ධාන්‍ය පිළිවෙතවල එක් කරන ලද තල් යුෂ (තල් යුෂ) ගුණාත්මක ඇගයීම.
- කුඩා ධාන්‍ය සමඟ එක්ව 'තල්කැවුම්' (පනම්පනියාරම්) නම් ස්වභාවික ආහාර ද්‍රව්‍යයක් වර්ධනය කිරීම.
- තල් සීනි සහ තල් පැණි වල ඇති ෆොස්පරස් අන්තර්ගතය ඇගයීම සඳහා ස්පෙක්ට්‍රොෆොටොමීටරි ක්‍රමවේදය සනාථ කිරීම.

5.6.4. ආහාර තාක්ෂණ විද්‍යාගාරය

පර්යේෂණ විශේෂාංග

- තල් යුෂ (Porous Flabellifer L.) සමඟ (ශ්‍රී ලංකාවේ සබරගමුවිශ්වවිද්‍යාලය සමඟ එක්ව) starch පදනම් වූ කෑමට සුදුසු කඩි අභිවෘද්ධිය, නිර්මාණය හා තත්ත්ව මූලයනය.
- පිරිසිදු පොල් මේදය බලපෑම, තල් යුෂයෙන් ජීව විද්‍යාත්මක මිශ්‍රණ හරහා සෑදුණු ගැලෙන සීනි වර්ග (ශ්‍රී ලංකාවේ සබරගමුවිශ්වවිද්‍යාලය සමඟ එක්ව).
- ආහාර කර්මාන්ත ශාලා ඉවතලන තල් යුෂ භාවිතා කර ගෙන ජීව විද්‍යාත්මක පදනමකින් ආහාරයට සුදුසු නිර්මාණය කිරීම (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ එක්ව).
- පිරිමි තල් ගසේ පුෂ්ප මංජරිය පදනම් කර ගෙන සෞඛ්‍ය සම්පන්න පිරිසිදු, තරුණ සමක් සඳහා මුහුණු පිරිසිදු කිරීමේ (ස්ක්‍රබ්) නිෂ්පාදනය (ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ එක්ව).
- තල් යුෂ පදනම් වූ හිස පාට වෙනස් කිරීමේ ක්‍රීම් (Hair Coloring Cream)නිර්මාණය . (ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සමඟ එක්ව)
- තල් යුෂ (Borassus flabllifer)පදනම් සමෙහි සංකූලතා නවතා දැමීමේ ශාකසාර වූ ක්‍රීම් නිර්මාණය. (කොළඹ විශ්වවිද්‍යාලය සමඟ එක්ව)

ප්‍රකාශන

1. තල් යුෂ පදනම් වූ සම ආරක්ෂා කරන නිෂ්පාදනවල ප්‍රතිඔක්සිකරණ ක්‍රියාකාරීත්වය - Industrial Crops and Products
2. අඩු කසළ සොයාගත් ස්වභාවික සුවර්ණිකාරක නිෂ්පාදනය - ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය, වාර්ෂික සමුළුව
3. තල් යුෂ (තල් යුෂ) පදනම් කරගත් මුහුණු ස්ක්‍රබ් - 2023
4. තෙතමනය ලබාදෙන මුහුණු ක්‍රීම්, ලොෂන් බාර් - කාර්මික සමුළුව
5. තල් යුෂ(තල් යුෂ) කිරි පානය - කාර්මික සමුළුව
6. සෞඛ්‍ය සම්පන්න ධාන්‍ය කුඩු වලින් නිපදවූ රොටී කැබලි - කාර්මික සමුළුව

5.6.5. උසස් තාක්ෂණ විද්‍යාගාරය

පර්යේෂණ විශේෂාංග

- යාපනයේ විවිධ භූගෝලීය ප්‍රදේශවලින් ලබාගත් මී රා ආශ්‍රිත සීනි නිෂ්පාදන වර්ග වල ගුණාත්මක විශ්ලේෂණය, තත්ත්වය, පෝෂණ අන්තර්ගතය සහ සෞඛ්‍ය ප්‍රතිලාභ.
- තල් යුෂ සමඟ කජු වයින් නිෂ්පාදනය.
- තල් යුෂ (පල්ප්) පළතුරෙහි අග්‍ර කොටසෙහි මේදය, පෝෂණ සහ ක්‍රියාකාරී ලක්ෂණ අධ්‍යයනය.
- තල් යුෂ (පල්ප්) පළතුරු සමඟ වෙනත් වියළි පළතුරු එකට මිශ්‍ර කර කැබලි වලට පරිවර්තනය.

ප්‍රධාන ක්‍රියාකාරකම්: ජලයේ දියවන විටමින්, මේදයේ දියවන විටමින්, සරල සීනි, බීටා කැරටීන් සහ සංරක්ෂක ද්‍රව්‍ය සඳහා HPLC ක්‍රම නිර්මාණය කරනු ලැබූ අතර, පලමුරු නිෂ්පාදනවල මීතනෝල් සහ එතනෝල් අන්තර්ගතය විශ්ලේෂණය සඳහා GC ක්‍රමද සංවර්ධනය කරන ලදී. ආදායම් උත්පාදන ක්‍රියාකාරකමක් ලෙස, මෙම වසරේදී වයින් සඳහා මීතනෝල් අන්තර්ගත පරීක්ෂණ වාර්තා 2ක් නිකුත් කරන ලදී

ප්‍රකාශන:

1. මේදය වෙන්කරගැනීම - කේ. දනුෂන් සහ සහකාර - 2023, බහු විෂයීය ජාත්‍යන්තර සමුළුව
2. කුළුබඩු සහ හකුරු ආශ්‍රිත නිෂ්පාදන - ජේ. ජේනා සහ සහකාර - 2023, තාක්ෂණික පර්යේෂණ හා නව්‍යතා සමුළුව
3. සක්‍රීය අඟුරු - තී. කේසවි සහ සහකාර - 2023, කෘෂිකර්ම හා පරිසර සමුළුව
